# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1728/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/11/2024 පැය 0925

## මාධ්‍ය නිවේදනය

**01. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.11.18 වන දින සවස් කාලයේ මන්නාරම පොලිස් වසමේ තල්ලඩි ප්‍රදේශයේදී මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගංජා කිලෝ 04 ග්‍රෑම් 315 ක්** සන්තකයේ තබා ගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන උයිලංකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - හංවැල්ල පොලිස් ස්ථානය.**

2024.11.18 වන දින රාත්‍රී කාලයේ හංවැල්ල පොලිස් වසමේ කලු අග්ගල, කහහේන හා පහත්ගම ප්‍රදේශවලදී හංවැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් 03 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 650 ක්, හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 700 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 670 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22, 30 හා 38 වයස්වල පසුවන හංවැල්ල සහ වග ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**
හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**